**ගඟඉහළ කෝරලේ ප්‍රාදේශිය සභාව**

**මහනුවර දිස්ත්‍රික්කය**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**-------------------------------------------**

**1.3.1 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**---------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.32,180,308 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.4,069,055 ක් වී තිබුණි.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.48,802,859 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.42,642,308 ක් වියදම් ණයහිමියෝ වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.9,954,819 ක් විය. 2014 ජූලි 30 දිනට තවදුරටත් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.9,874,819 ක් විය.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,449,862 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.413,651 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.7,036,211 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.**

**-----------------------------------**

**සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ ඌනතාවය සමග සැදීමේ දි, රු.7,036,211 ක වර්ධනයක් වූ අතර, ඒ සඳහා 2013 වර්ෂයේ දි ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු වියදම සියයට 74 කින් අඩුවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**--------------------------------------**

**මුලු ජංගම වත්කම්වලට ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 1.4:1 ක් වූයෙන්, එය ප්‍රශස්ථ මට්ටමක නොපැවතිණි. සමස්ත ජංගම වත්කම්වලින් සියයට 65 ක්ම හිඟ ආදායම්වලින් සමන්විත වී ඇති අතර, ජංගම වගකීම්වලින් සියයට 85 ක්ම කර්මාන්ත ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.**

**2.4 ආදායම් පරිපාලනය.**

**---------------------**

**(අ) වරිපනම් බදු**

**----------------**

**සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.1,883,602 ක හිගයක් පැවති අතර, එම මුදලින් අය වී තිබුණේ රු.465,791 ක් හෙවත්, සියයට 25 ක ප්‍රමාණයක් පමණි. රු.827,133 ක් වූ වර්ෂය සඳහා බිල් කිරීම්වලින් වර්ෂය තුළ රු.294,883 ක් හෙවත්, සියයට 35 ක් පමණක් රැස් කර තිබුණි.**

**(ආ) කඩ කුළී.**

**---------------**

**සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අය වියයුතු හිග කඩ කුළී ආදායම රු.782,160 ක් විය.**

**(ඇ) ජල ගාස්තු.**

**------------**

**(a) ජල ව්‍යාපෘති අක්‍රීය වීම නිසා, ප්‍රදේශ 10 ක ජලය බිල් කිරීම අත්හිටුවා තිබූ අතර, එම ප්‍රදේශවලින් හිග හිට තිබූ ජල ගාස්තු වටිනාකම රු.85,464 ක් වී තිබුණි.**

**(b) සභාව සතු ජල ව්‍යාපෘති 05 න් 02 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර, ව්‍යාපෘති දෙකෙන් ද සමාලෝචිත වර්ෂය අවසානයට රු.71,032 ක හිගයක් පවතී.**

**(ඈ) පරිසර බලපත්‍ර.**

**------------------**

**1988 අංක 56 සහ 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත ව්‍යාපෘති සඳහා පරිසර බලපත්‍ර ලබා ගත යුතු බවට අවධාරණය කර තිබුණ නමුත්, පරිසර බලපත්‍ර ලබා**

**නොගෙන, ව්‍යාපාර පවත්වා ගෙන යන අවස්ථා 14 ක් වෙනුවෙන් සභාවට රු.56,000 ක මුදලක් අහිමි වී තිබුණි.**

**(ඉ) ත්‍රිරෝද රථ ගාස්තු**

**--------------------**

**සමාලෝචිත වර්ෂයේ දි ත්‍රිරෝද රථ නැවතුම් සඳහා ඇස්තමේන්තුගත රු.200,000 ක් වු මුදලින් වර්ෂය තුළ අය කර ගෙන තිබුණේ රු.96,675 ක් පමණි.**

**(ඊ) උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**---------------------------**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.642,664 ක් හා මුද්දර ගාස්තු රු.11,629,920 ක් ලැබියයුතුව පැවතුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**---------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**---------------------------**

**2010 වර්ෂයේ දි සභා අරමුදලින් රු.384,096 ක් වැය කර ආරම්භ කර තිබු ජීව වායු ඒකකය මසක පමණ කාලයක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතී පසුව, අක්‍රීය වී තිබුණද 2014 වර්ෂය දක්වාම යථා තත්ත්වයට පත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ රු.200,000 ක මුදලක් අලුත්වැඩියා කිරීමට වෙන් කර, එම මුදල ඉතිරි කර තිබුණි.**

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය.**

**----------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) ඇත්ගාල සිංහපුර ගමමැද පාර සංවර්ධනය කිරීම.

---------------------------------------------------

වැඩ විෂයය අංක **04** යටතේ **G 20 (1:2:4 (3/4 ")** කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් පැති බැම් අගල් **10** ඝනකමට ඉදි කළයුතු වුව ද, අවස්ථා **04** ක දී, සිදු කරන ලද පරීක්ෂාවේ ඝනකම පිළිවෙළින් අගල් **6", 6", 5 ½ "** සහ **6 ½ "** ක් වී තිබුණි.

(ආ) ලක්ෂය පිහිල්ල **1** අදියර සංවර්ධනය කිරීම.

---------------------------------------------

වැඩ විෂයය අංක **04** යටතේ **G 20 (1:2:4 (3/4 ")** කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් පැති බැම් **10"** ක් ඝනකමට ඉදි කළයුතු වුව ද, අවස්ථා **04** ක දි ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේ දි ඝනකම **7 ½", 8 ½", 7 "** සහ **6"** ක් ආදි වශයෙන් යුක්ත වී තිබුණි.

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

------------------------------------

**4.1** ප්‍රසම්පාදන සැළැස්ම.

-----------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.2** විගණන හා කළමනාකරණ කමිටු.

-----------------------------------

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය.**

**-----------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**4.4 අයවැය පාලනය.**

**------------------**

**සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ අයවැය ලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල අගයයන් සමග සැසඳීමේ දි, වියදම් විෂයයන් 06 ක සියයට 10 සිට සියයට 58 ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය විය.**

**5. පද්ධති හා පාලන.**

**--------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) අයවැය පාලනය.**

**(ආ) ආදායම් පරිපාලනය**

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය**